# ජනසංඛ්‍යාව වියපත්වීම සහ එයින් උද්ගතවන සමාජ, ආර්ථික බලපෑම්: ගොඩකවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**පී. ඒ. දිල්රුක්ෂි[1]**
**චාමින්ද අබේසිංහ[2]**

සංක්ෂේපය

ජනගහනයේ සිදුවන වර්ධනය වැළැක්විය හැකි සංසිද්ධියක් නොවේ. මෙලෙස සිදුවන ජනගහන වර්ධනයේ ඇති වන සුවිශේෂිම ප්‍රවණතාවය ලෙස හඳුනාගත හැකිවන්නේ ජනගහනය සිදුවන වියපත් වීමයි. රටක ජනගහනයේ වයස් ව්‍යුහය තුළ ඇතිවන්නා වූ වෙනස්කම් පදනම් කරගනිමින් මෙසේ ජනගහනය වියපත් වීම සිදු වේ. උපත්, මරණ සහ ආයු අපේක්ෂාව යනු වියපත් ජනගහනයක් උත්පාදනය කිරීමෙහිලා මුල් වි ඇති මූලික ප්‍රජා විද්‍යාත්මක සංරචකයන්ය. මේ වන විට ලෝකයේ ජනගහනය වියපත් වීමේ වැඩි වර්ධනයක් හදුනාගත හැකිය. කෙසේ නමුත් මේ ආකාරයට සිදුවන ජනසංඛ්‍යාවේ වියපත් වීම ලෝකයේ සෑම රටකම එක සමාන ආකාරයෙන් සිදු නොවේ. සාමාන්‍යයෙන් අප්‍රිකානු සහ ලතින් ඇමරිකානු කලාපවලට සාපේක්ෂව ආසියානු කලාපය තුළ වියපත් ජනගහනයේ ඉහළ අගයක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවේ තත්ත්වය ගතහොත් ආසියාතික රටවල් අතුරින් ජනගහනයේ වියපත් වීම වේගයෙන් සිදුවන රටක් ලෙස සැලකේ. මේ වනවිට සාක් කලාපිය රාජ්‍යයන් අතරද ඉහළම වැඩිහිටි ජනගහනයක් වාර්තාවන්නේ ශ්‍රී ලංකාවෙනි. මෙරට පවතින සැබෑ සමාජ ප්‍රශ්නයක් වන්නේ මෙම ජනගහනයේ වයස්ගත ප්‍රතිශතය ඉහළ යාමයි. එමෙන්ම පුද්ගලයන්ගේ වැඩි ජීවිත අපේක්ෂාවන්, පවුල්වල අඩු දරු උපත් සංඛ්‍යාවක් සිදුවීම වැනි දේ නිසා පවුල් සංස්ථාවලට සහ රාජ්‍ය ආර්ථිකයට සිදුවන්නේ ධනාත්මක බලපෑමක්ද? ඍණාත්මක බලපෑමක්ද? යන්න විමසා බැලීම වැදගත් වේ.

මේ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ වියපත්භාවයට පත්වන ජනකොටස් සමාජ සහ ආර්ථික ක්ෂේත්‍රයන්ට සිදුකරන බලපෑම හඳුනාගැනීම සහ එම බලපෑමේ ස්වභාවය හඳුනාගැනීමයි. මෙම අරමුණ ඉටුකර ගැනීම සදහා යොදාගනු ලබන ක්‍රමවේදය වන්නේ සිද්ධි අධ්‍යයන ක්‍රමවේදයයි.. අධ්‍යයන ප්‍රදේශය වශයෙන් ගොඩකවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තෝරාගනු ලබන අතර අවශ්‍ය දත්ත ලෙස ප්‍රාථමික දත්ත සහ ද්විතියික දත්ත භාවිතා කරනු ලබයි. ප්‍රාථමික දත්ත රැස්කිරීමේදි ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා භාවිතා කරන ලදි. රැස්කරගනු ලැබු දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක සහ ප්‍රමාණාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය යොදාගනු ලබයි. මෙම අධ්‍යයනයෙන් අනාවරණය කරගත් අන්දමට ජනසංඛ්‍යාව වියපත්වීම තම පවුලේ ආර්ථිකයටත්, පොදුවේ රාජ්‍ය සුබසාධන වියදම්වලටත් ආර්ථික වශයෙන් බලපෑම් එල්ල කර තිබේ. සමාජමය වශයෙන් වියපත්වුවන්ගේ දුර්වල සෞඛ්‍යය තත්ත්වය, තනිවම වැඩ කර ගැනීමේ නොහැකියාව, සමාජමය වශයෙන් දක්වන ක්‍රියාකාරීත්වයේ අඩුවීම, පවුල තුළ හුදකලා වීම වැනි බලපෑම් ඇති වී තිබේ. පළපුරුද්ද, දැනුම සහ පරිනතභාවය ඇති වයස්ගත පුද්ගලයන්ගේ දායකත්වය ලබාගත හැකිවන ආකාරයට රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම තුළින් වියපත්වුවන් තුලින් එල්ලවන බලපෑම් වලින් මිදිය හැකි බවට යෝජනා කළ හැකිය. එමෙන්ම වියපත්වුවන් රැකබලාගැනීම සඳහා අවශ්‍ය විධිමත් යාන්ත්‍රණ සකස් කිරීම ද වැදගත් වේ.

ප්‍රමුඛ පදඃ ජනසංඛ්‍යාව, ජනගහනය, වියපත්වීම, වැඩිහිටි ජනතාව, ශ්‍රී ලංකාව

---

1 ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

2 *ආචාර්ය,* ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය